# රිච්මන්ඩ් විද්‍යාලය - ගාල්ල Richmond College, Galle

**පැවරුම් අංක 1** **12 සහ 13 ශ්‍රේණිය**
**(නිපුණතාව 01 )**

**ආර්ථික විද්‍යාව** **කාලය පැය 2 යි**

ප්‍රශ්න 5 ටම පිළිතුරු සපයන්න

(1) **(i)** ආර්ථික සම්පත් ඔබ අර්ථ දක්වන්නේ කෙසේද ඒවායේ වර්ගීකරණය දක්වන්න
**(ii)** ආර්ථික විද්‍යාවේ දී නිෂ්පාදන සාධකයක් ලෙස ශ්‍රමය අර්ථ දක්වන්න
**(iii)** ප්‍රාග්ධන සම්පාදනයේ ප්‍රධාන ප්‍රභවයන් කවරේද
**(iv)** දළ ආයෝජනය ශුද්ධ ආයෝජනයෙන් වෙනස් වනුයේ කෙසේද
**(v)** ප්‍රාග්ධනය නිෂ්පාදිත නිෂ්පාදන සාධකයකි පැහැදිලි කරන්න
( කොටසකට ලකුණු 4 බැගිනි .)

(2) (අ) **(i)** සම්පත් හිගකම හා භාණ්ඩ හිගකම අතර වෙනසක් තිබේද පැහැදිලි කරන්න
**(ii)** ස්ථාවර ආවස්ථික පිරිවැයක් බිහි වන්නේ කුමන තත්වයක් යටතේද
**(iii)** කිසියම් ආර්ථිකයක ශ්‍රමිකයන් 20 දෙනෙක් පමණක් සිටින බවත් එක් දිනකට එක් ශ්‍රමිකයකුට ආහාර ඒකක 20 ක් හෝ රෙදි ඒකක 16 ක් නිපදවිය හැකි බවත් සිතන්න.
මෙම තොරතුරු ඇසුරින් නිෂ්පාදන හැකියා මායිම නිර්මාණය කරන්න
( කොටසකට ලකුණු 4 බැගිනි .)

(ආ) පහත දැක්වෙන තත්වයන් නිෂ්පාදන හැකියා මායිම් රූප සටහන් වල පෙන්වන්න.
**(i)** වසංගත රෝගයක් පැතිරීම අවසන් වීමෙන් පසු සම්පත් භාවිතය ඉහළ යාම .
**(ii)** **covid -19** වෛරස් රෝගය නිසා .මිනිසුන් විශාල ප්‍රමාණයක් මිය යාම
**(iii)** ආවස්ථික පිරිවැයක් නොමැතිව **X** භාණ්ඩ නිමවුම ඉහළ යාම
**(iv)** **x** භාණ්ඩය සඳහා සම්පත් වැඩි කිරීම ( කොටසකට ලකුණු 2 බැගිනි .)

(3) (1) ඕනෑම සමාජයක් විසින විසඳා ගත යුතු පොදු මූලික ආර්ථික ප්‍රශ්න කවරේද ?
(11) මූලික ආර්ථික ප්‍රශ්න සෑම සමාජයකටම පොදු වේ මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.
**(iii)** කුමක් නිපදවිය යුතු ද යන මූලික ආර්ථික ප්‍රශ්නයෙන් කුමක් අදහස් කරන්නේ ද ? රූප සටහනකින් පැහැදිලි කරන්න
**(1v)** ආර්ථිකයක නිෂ්පාදිතය බෙදීයාමට අදාළ මූලික ආර්ථික ප්‍රශ්නය කුමක් ද වෙළඳපළ ආර්ථිකයක එම ප්‍රශ්නය විසඳෙන ආකාරය පැහැදිලි කරන්න
**(v)** සම්පත් හිමිකාරත්වය හා අයිතිවාසිකම් සම්පත් බෙදාහැරීමේ යන්ත්‍රනය සහ සානුබල සැපයීමේ ස්වරූපය මත ආර්ථික පද්ධති වර්ග කරන්නේ කෙසේද ?
(කොටසකට ලකුණු 4 බැගිනි)

**(4) (i)** ආර්ථික පද්ධතියක් යන්න අර්ථ දක්වන්න ?
**(ii)** වෙළඳපළ ක්‍රමය යටතේ කෙසේ නිපදවන්නේද යන්න විසඳා ගන්නේ කෙසේද
**(iii)** වෙළඳපොල ආර්ථිකයක මිල යන්ත්‍රනය මගින් විකල්ප නිෂ්පාදන අතර සම්පත් බෙදීයන ආකාරය පැහැදිලි කරන්න
**(iv)** සමාජවාදී වෙළඳපල ආර්ථිකයක් සහ සමාජීය වෙළඳපළ ආර්ථිකයක් යන්න කෙටියෙන් පැහැදිලි කරන්න
**(v)** සැලසුම්ගත ආර්ථිකයක දැකගත හැකි මූලික ලක්ෂණයන් කවරේද ?

(කොටසකට ලකුණු 4 බැගිනි)

(5) **(i)** මධ්‍යගත සැලසුම් ආර්ථික පද්ධතියක් තුල මූලික ආර්ථික ප්‍රශ්නයක් ලෙස සම්පත් බෙදා හැරීමේ ප්‍රශ්නය විසදා ගනු ලබන්නේ කෙසේද ? පැහැදිලි කරන්න.

**(ii)** රාජ්‍ය අසාර්ථක වීමක් යනුවෙන් කුමක් අදහස් කරන්නේද ඒ සඳහා බලපාන සාධකයන් කවරේද ?

**(iii)** මධ්‍යගත සැලසුම් ආර්ථික පද්ධති මෑත කාලයේ බිඳ වැටීමට බලපෑ සාධකයන් කවරේද?

**(iv)** වෙළඳපළ අසාර්ථකවීම් යන්න පහදන්න.

**(v)** වෙළඳපළ ක්‍රමය තරගකාරී වීම සඳහා අවශ්‍ය කොන්දේසි කවරේද ?

(කොටසකට ලකුණු 4 බැගිනි)

සුජිත් චන්ද්‍රවීර මයා
**රිච්මන්ඩ් විද්‍යාලය**